# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,928 - 2015 අගෝස්තු මස 14 වැනි සිකුරාදා - 2015.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1290 |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1291 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1292 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1298 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 සැප්තැම්බර් මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1345 - B 80969 - 5,352 (2015/07)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට, Rail Joint Shims යුගල 7,200 ක් සැපයීම සඳහා ප්‍රසම්පාදනය**

ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ( ප්‍රධාන) හි සභාපති විසින් Rail Joint Shims යුගල 7,200ක් මිලයට ගැනීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසුකරුවන්ට ස්වකීය ලංසු සෘජුව හෝ තමන් විසින් ඇටර්නි බලය මගින් බලය පවරනු ලැබූ, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතවරයෙකු මගින් ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු, ආපසු ගෙවනු නොලබන ශ්‍රී ලංකා රුපියල් 3,000.00 පමණක් හෝ පහසුවෙන් පරිවර්තනය කර ගත හැකි මුදල් වර්ගයකින් වන සමාන වටිනාකමින් යුත් මුදලක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාල (දූත මණ්ඩල) වෙතින් හෝ ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ 2015.09.09 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍ර මත පමණක් ඉදිරිපත් කළ යුතු ය.

03. ලංසු භාරගැනීම, 2015.09.10 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට අවසන් වේ.

04. Rail Joint Shims නිෂ්පාදනය/සැපයීම් ISO 9001 : 2008 සහතිකලත් හෝ ගැනුම්කරුට පිළිගත හැකි සමාන ජාත්‍යන්තර තත්ත්ව කළමනාකරණ ක්‍රම පද්ධති ප්‍රමිති සහතිකලත් සමාගම් විසින් ඉටු කළ යුතු ය.

05. ලංසු, ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරි කාර්යාලයේදී එම ලංසු භාරගන්නා වේලාව අවසන්වූ වහාම විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට පැමිණ සිටිය හැකි ය.

06. මුද්‍රා තබන ලංසු, පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

07. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය. වැඩිදුර විස්තර සඳහා කරුණාකර විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.slrail.info

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7260

08-443

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ කොළඹ අංගනයේ හා රත්මලාන අංගනයේ පවත්නා යකඩ රැල් (යතු කුඩු) මිලදී ගෙන ඉවත් කර ගැනීම**

ප්‍රසම්පාදන අංක - SRS/F. 7242

ශ්‍රී ලංකාවේ කොළඹ 10, ඕල්කොට් මාවතේ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින්, කොළඹ දුම්රිය අංගනයේ හා රත්මලාන දුම්රිය අංගනයේ පවත්නා යකඩ රැල් (යතු කුඩු) මිලදී ගෙන ඉවත් කර ගැනීම සඳහා වසරක කාලයක් සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු භාරගැනීම 2015.09.03 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) පස්වරු 2.00 ට අවසන් කෙරේ.

03. ආපසු ගෙවනු නොලබන ලේඛන ගාස්තු රුපියල් 3,000.00 (රුපියල් තුන්දහසක් පමණයි) ගෙවීමෙන්, 2015.09.02 වැනි දින පස්වරු 3.00 දක්වා, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර මගින් ලංසු ඉදිරිපත් කළ යුතු වේ.

04. අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, සාමාන්‍යාධිකාරි කාර්යාලයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුහට හෝ ඔහුගේ බලය පැවරූ නියෝජිතයෙකු හට එම අවස්ථාවට පැමිණ සිටින ලෙසට ඉල්ලීමක් කෙරේ.

05. මුද්‍රා තැබූ ලංසු, ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන් පහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
සාමාන්‍යාධිකාරී කාර්යාලය,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
කොළඹ 10.
ශ්‍රී ලංකාව.

06. ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ලංසු ලේඛන නොමිලයේ පරීක්ෂා කොට බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත
කොළඹ 10.
ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
URL. www.slrai.info
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7242

08-444

**ලංසු සඳහා ආරාධනයයි**

ශ්‍රී ලංකා දුම්රිය සේවය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා EN 45 E1 (අඩි 45) රේල් පිලි 5,000ක් සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංක - SRS/F. 7196

ශ්‍රී ලංකාව, කොළඹ, තැ. පෙ. 355 දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත EN 45 E1 අඩි 45 (මී. 13.716) රේල් පීලි 5,000ක් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ලංසුකරුවන්, ඇටෝර්නි බලයක් මගින් බලගන්වන ලද බලයලත් නියෝජිතයකු මගින් ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කළ හැක.

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. මේ පිළිබඳ උනන්දුවක් දක්වන යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වැඩි තොරතුරු පහත සඳහන් අයගෙන් වැඩ දිනයන්හි පෙ. ව. 9.00 සහ ප. ව. 3.00 අතර ලබාගත හැකි අතර, එම ලිපිනයේ මෙහි සඳහන් වේලාවන් තුළ දී ලිපිලේඛන පරීක්ෂාකර බැලිය හැක.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ඕල්කොට් මාවත,
කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2473328
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

04. සුදුසුකම් අවශ්‍යතා සඳහා පහත සඳහන් දෑ ඇතුළත් වේ. :-

(අ) මෙම කොන්ත්‍රාත්තුව යටතේ සපයනු ලබන භාණ්ඩ, මෙම ලංසු ලිපිලේඛන සමග නිකුත් කරනු ලබන RSS 557 (A) දුම්රිය ගබඩා පිරිවිතරවලට අනුකූල විය යුතුයි.

(ආ) සැපයීමට ඇති එක් එක් අයිතමය පිළිබඳ නිර්මාණ සහ නිෂ්පාදනය සඳහා වන ISO 9001 : 2008 හි පිටපත් ලංසු සමග ඉදිරිපත් කළ යුතුයි.

05. (අ) ඕනෑම ලංසුකරුවෙකු වෙනුවෙන් යම් පුද්ගලයකු ඒජන්තවරයකු, උප ඒජන්තවරයකු නියෝජිතයකු හෝ නම්කළ අයකු ක්‍රියාකරන්නේ නම් ලංසු ඉදිරිපත් කිරීමට පෙර ඔහු/ඇය 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතින් ඉල්ලා සිටින පරිදි ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර් සමග ලියාපදිංචි විය යුතුයි. ලංසුව සමග ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුයි. එසේ ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් නොකරන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) 1987 අංක 03 පොදු කොන්ත්‍රාත් පනත ප්‍රකාරව ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කළ වහාම, නමුත් ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීමට පෙර තමන්ව ලියාපදිංචි කළ හැක. අදාළ ප්‍රසම්පාදන කමිටුව වෙත පොදු කොන්ත්‍රාත් පනතේ නියමයන් ප්‍රකාරව නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය ඉදිරිපත් නොකරන එවැනි ලංසුකරුවකුට ප්‍රසම්පාදනය ප්‍රදානය නොකරනු ලැබේ.

06. ආපසු ගෙවනු නොලබන රු. 20,000ක ප්‍රසම්පාදන ගාස්තුවක් ශ්‍රී ලංකා මුදලින් හෝ ඊට සමාන මුදලක් පහසුවෙන් පරිවර්තනය මුදල් වර්ගයකින් ගෙවීමෙන් අනතුරුව 2015.09.11 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයට හෝ විදේශ රටක ශ්‍රී ලංකා දූත කාර්යාලයට ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.

07. 2015.09.14 වැනි දින ප. ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලංසු පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුයි.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය,
බිම් මහල, අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2015.09.14 වැනි දින ප. ව. 2.00 ට කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 1 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේදී එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරේ.

සභාපති,
අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද
ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව,
අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 1, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

2015 ජූලි මස 20 වැනි දින.

08-445

---

**අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය**

ප්‍රසම්පාදන දැන්වීම

පාවිච්චි කරන ලද අංක 300 - 6156 දරන නිසාන් සනී මෝටර් රථය විකිණීමට ටෙන්ඩර් කැඳවනු ලැබේ. 2015.08.17 වැනි දින සිට 2015.08.21 වැනි දින දක්වා වාහනය මෙම කාර්යාල භූමියේ දී පරීක්ෂා කර බැලිය හැක.

*මිල ගණන් කැඳවීම* .- 2015.08.17 දින සිට 2015.08.28 වැනි දින දහවල් 12 දක්වා රු. 200 ක් ගෙවා කාර්යාල වේලාවන් තුළ දී ටෙන්ඩර් ආකෘති පත්‍ර මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ආපසු ගෙවන ටෙන්ඩර් තැන්පත් මුදල රු. 1,000 කි.

*ටෙන්ඩර් විවෘත කිරීම*. - 2015.08.28 දින ප. ව. 2.00 ට

ටෙන්ඩර් ඉල්ලුම්පත් ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ටෙන්ඩර් විවෘත කරන වේලාවට ප්‍රථම බහාලිය හැක. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහලින් ''වාහනය සඳහා මිල ගණන්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

*ටෙන්ඩර් ඉල්ලුම්පත් ලැබිය යුතු ලිපිනය* .- ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 573, අලුත්කඩේ, කොළඹ 12.

ජී. මැද්දෙගොඩගේ,
සහකාර ලේකම් (මුදල්),
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2015 ජූලි මස 29 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
කොළඹ.

08-380

---

**මහාධිකරණය - බදුල්ල**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

වැලිමඩ, දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ සහ බණ්ඩාරවෙල, මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් රථවාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන්පත් කැඳවනු ලැබේ.

1. ටෙන්ඩර් පෝරමපත් නිකුත් කිරීම : 2015.08.14 දින සිට 2015.08.31 දින දක්වා
2. ටෙන්ඩර් අයදුම්පත්‍ර භාර ගැනීම : 2015.09.15 දින ප. ව. 2.00 දක්වා
3. ටෙන්ඩර් අයදුම්පත් විවෘත කිරීම : 2015.09.15 දින ප. ව. 2.30 ට බදුල්ල මහාධිකරණ කාර්යාලයේ දී පැවැත්වේ.

02. ටෙන්ඩර් අයදුම්පත් එවිය යුතු ලිපිනය : ''සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ඌව පළාත්බද මහාධිකරණය, බදුල්ල'' යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් පමණක් 2015.09.15 දිනට පෙර එවිය යුතු අතර, ටෙන්ඩර්පත් අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් පස කෙළවරේ අදාල වාහන අංකය සමග ''වාහන සඳහා මිලගණන්පත් ඉදිරිපත් කිරීම'' යනුවෙන් සඳහන් කර එවිය යුතුයි.

03. ටෙන්ඩර් පෝරමපත් බදුල්ල මහාධිකරණ කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් මගින් විකිණීමට යෝජිත වාහනවල විස්තර හා ටෙන්ඩර් තැන්පත් මුදල් ගෙවිය යුතු ආකාරය පහත දක්වේ. :-

| | *වාහන වර්ගය හා විස්තරය* | *වාහන අංකය* | *අවම ලංසු මුදල* | *ටෙන්ඩර් ඇප තැන්පත්* | |
|---|---|---|---|---|---|
| | | | | *ආපසු නොගෙවන මුදල* | *ආපසු ගෙවන මුදල* |
| | | | *රු.* | *රු.* | *රු.* |
| 01. | Honda වර්ගයේ ලොරි රථ 01ක්<br>650.00 CC<br>නිෂ්පාදිත වර්ෂය : 2002<br>Fuel - Petrol | WP LE 3098 | 450,000.00 | 100.00 | 4,500.00 |
| 02. | BAJAJ වර්ගයේ ත්‍රිවිල් රථ 01<br>200.00 CC<br>නිෂ්පාදිත වර්ෂය 2011<br>Fuel - Petrol | UP YJ 9418 | 110,000.00 | 100.00 | 1,000.00 |
| 03. | BAJAJ වර්ගයේ ත්‍රිවිල් රථ 01ක්<br>150.00 CC<br>නිෂ්පාදිත වර්ෂය : 2000<br>Fuel - Petrol | UP GF 3636 | 60,000.00 | 100.00 | 1,000.00 |
| 04. | TVS වර්ගයේ යතුරු පැදි 01ක්<br>90.00 CC<br>නිෂ්පාදිත වර්ෂය : 2011<br>Fuel - Petrol | UP BAF 3793 | 55,000.00 | 100.00 | 1,000.00 |

| | වාහන වර්ගය හා විස්තරය | වාහන අංකය | අවම ලංසු මුදල රු. | ටෙන්ඩර් ඇප තැන්පත් ආපසු නොගෙවන මුදල රු. | ආපසු ගෙවන මුදල රු. |
|---|---|---|---|---|---|
| 05. | BAJAJ වර්ගයේ ත්‍රීවිල් රථ 01ක් 145.45 CC නිෂ්පාදිත වර්ෂය : 2005 Fuel - Petrol | UP QC 6685 | 60,000.00 | 100.00 | 1,000.00 |
| 06. | ජීප් රථ 01ක් (මෙම වාහනයේ ලියාපදිංචිය සඳහා ව්‍යාජ තොරතුරු ඇතුලත් කර ලියාපදිංචි කර ඇති බැවින්, මෙම වාහනය කොටස් වශයෙන් භාවිතා කළ යුතු වාහනයක් ලෙසට නිර්දේශිත වාහනයකි) | 32-0658 | 200,000.00 | 100.00 | 2,000.00 |

04. අංක 01 සිට 05 දක්වා ඇති වාහන පරීක්ෂා කිරීම වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වැලිමඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ද, අංක 06 යටතේ දක්වා ඇති වාහනය පරීක්ෂා කිරීම බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය මත බණ්ඩාරවෙල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ද 2015.08.07 වැනි දින සිට 2015.08.10 වැනි දින දක්වා කාලය තුළ පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා කාර්යාල වේලාවන්හි දී සිදුකළ හැකි ය.

05. ජයග්‍රහණය කරනු ලබන ලංසුකරු වෙත ඒ බව ලිඛිතව දැනුම්දෙනු ලබන අතර, එම දැන්වීම ලැබීමෙන් අනතුරුව අදළ ලංසුකරු විසින් සතියක් ඇතුළත ගෙවිය යුතු සම්පූර්ණ මුදල අදල අධිකරණයට මුදලින් ගෙවා, එකී වාහනය අධිකරණ භූමියෙන් ඉවත් කරගැනීමට කටයුතු කළ යුතු ය.

06. බදුල්ල මහාධිකරණයේ ටෙන්ඩර් මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

නාමල් බණ්ඩාර බලල්ලේ,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත්බද මහාධිකරණය,
බදුල්ල.

2015 ජූලි මස 20 වැනි දින,
බදුල්ල, ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

08-283

---

**මහාධිකරණය - අම්පාර**

ටෙන්ඩර් කැඳවීම

නැගෙනහිර පළාත්බද මහාධිකරණයට අයත්, අම්පාර දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය හා දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද, හිමිකම් නොපාන ලද රථ වාහන ටෙන්ඩර් මගින් විකිණීම.

පහත සඳහන් නඩු අංක සහිත වාහන සඳහා ටෙන්ඩර්පත් 2015.08.14 වැනි දින සිට 2015.09.08 වැනි දින පෙ. ව. 10.30 දක්වා භාරගනු ලැබේ.

**දෙහිඅත්තකණ්ඩිය මහෙස්ත්‍රාත් අධිකරණය**

| | නඩු අංකය | වාහන අංකය | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 01. | 4949 | LD-1776 ලොරි රථය | 10,000 |
| 02. | 7036 | XI - 9662 යතුරු පැදිය | 1,000 |
| 03. | 2593 | 26-1054 ලොරිරථය | 1,000 |
| 04. | 5653 | NCUW 9958 යතුරු පැදිය | 1,000 |
| 05. | 6992 | EPQT 3970 ත්‍රිවිල් රථය | 1,000 |

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - අම්පාර

| | නඩු අංකය | වාහන අංකය හා වර්ගය | ආපසු ගෙවන ඇප තැන්පත් මුදල රු. |
|---|---|---|---|
| 01. | 47830 | 26-3860 ලොරි රථය | 5,000 |
| 02. | 50528 | EPQT-0504 ත්‍රීවිල් රථය | 2,000 |

ටෙන්ඩර් ඉල්ලුම්කරු අදාළ වාහනයට අයත් ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල අම්පාර මහාධිකරණයේ තැන්පත් කළ යුතු අතර ආපසු නොගෙවනු ලබන රු. 100 ක මුදල ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර හා විස්තර 2015.09.08 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට අම්පාර මහාධිකරණයේ ගිණුම් අංශයෙන් ලබාගත හැක.

මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති ගරු මහාධිකරණ විනිසුරුතුමා, මහාධිකරණය, අම්පාර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මහාධිකරණයට පැමිණ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතු ය. ටෙන්ඩර්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''රථවාහන සඳහා ටෙන්ඩර් කැඳවීම - 2015'' ලෙස හා වාහන අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට කාර්යාල වේලාව තුළ අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හමුවී තම අනන්‍යතාවය තහවුරු කර වෙන්දේසි වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

ටෙන්ඩර්පත් භාර ගැනීම 2015.09.08 වැනි දින පෙ. ව. 11.30 ට අවසන් වේ. තැපෑලෙන් ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ. තවද, තක්සේරු වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වේ.

ටෙන්ඩර්පත් භාර ගන්නා අවසන් දින ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් මහාධිකරණය, අම්පාර වෙත පැමිණ සිටිය යුතු අතර 2015.09.08 වැනි දින ප. ව. 2.00 ට ටෙන්ඩර්පත් විවෘත කර මිළ ගණන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනතුරුව අම්පාර මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව මගින් වැඩිම මිළ ගණන් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි.

එම තීරණය අදාළ ටෙන්ඩර්කරුට දැනුම්දීමෙන් අනතුරුව සති දෙකක් ඉක්ම යාමට පෙර වාහනයට අදාළ මුදල ගෙවීමෙන් පසු ටෙන්ඩර්කරුට හෝ බලය පැවරූ නියෝජිතයාට තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසුව වාහනය මුද හරිනු ලබන අතර එදිනම එය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු වේ.

චෙක්පත් භාර නොගන්නා අතර මුදල් පමණක් භාරගනු ලැබේ.

මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් අම්පාර මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

සුමුදු ප්‍රේමචන්ද්‍ර,
මහාධිකරණ විනිසුරු,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
මහාධිකරණය, අම්පාර.

2015 ජූලි මස 27 වැනි දින,
අම්පාර මහාධිකරණයේ දී ය.

08-446

---

**බස්නාහිර පළාත්බද අවිස්සාවේල්ල මහාධිකරණයට අයත් අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොපාන වාහන ටෙන්ඩර් පටිපාටිය මගින් විකිණීම**

පහත සඳහන් නඩු අංක සහිත වාහන සඳහා ටෙන්ඩර්පත් 2015.09.15 වැනි දින දක්වා භාරගනු ලබන අතර එකී වාහන සඳහා ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල ද ඇතුළු විස්තර පහත සඳහන් පරිදි වේ :-

| | නඩු අංකය | වාහනය | වාහන වර්ගය | ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල |
|---|---|---|---|---|
| 01. | බී/5479/10 | ජීප් රථය | 31-9548 | 5,000 |
| 02. | 45146 | ත්‍රීවීල් රථය | WP - YS - 5004 | 2,000 |
| 03. | 50061 | ලොරි රථය | SG - LF - 2166 | 5,000 |
| 04. | 34345 | ලොරි රථය | SG - GE - 8559 | 5,000 |

ටෙන්ඩර් ඉල්ලුම්පත් සහ විස්තර අවිස්සාවේල්ල මහාධිකරණයෙන් රු. 100 ක මුදලක් ගෙවා ලබා ගත හැකි අතර 2015.09.14 වැනි දින පස්වරු 4.00 ට ටෙන්ඩර්පත් නිකුත් කිරීම අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් ඉල්ලුම්පත් කාර්යාල වේලාව තුළ (පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා) අවිස්සාවේල්ල මහාධිකරණයට පැමිණ ටෙන්ඩර්කරු හෝ නියෝජිතයෙකුට ලබාගත හැකි අතර මුද්‍රා තබන ලද ටෙන්ඩර්පත් කාර්යාලයට පැමිණ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ටෙන්ඩර් ඉල්ලුම්පතේ අනු අංකය සහ ඉල්ලුම් කරන වාහනයේ අංකය සඳහන් කළ යුතු ය.

ටෙන්ඩර්කරුට හෝ නියෝජිතයෙකුට කාර්යාල වේලාව තුළ අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය හමුවී ඔහුගේ අනන්‍යතාවය තහවුරු කර ටෙන්ඩර් වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

ටෙන්ඩර්පත් භාරගැනීම 2015.09.15 වැනි දින පෙ. ව. 9.30 ට අවසන් වන අතර ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ. තවද, තක්සේරු වටිනාකමට අඩුවෙන් ඉල්ලුම්කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප වේ.

ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ එනම් 2015.09.15 වැනි දින ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන් විසින් ලිඛිතව බලය පවරන ලද නියෝජිතයන් පෙ. ව. 10.00 ට අවිස්සාවේල්ල මහාධිකරණය වෙත පැමිණ සිටිය යුතු අතර එදින පෙ. ව. 10.00 ට ටෙන්ඩර්පත් විවෘත කර මිල ගණන් ප්‍රකාශයට පත් කරනු ලැබේ. නියමිත වේලාවට නොපැමිණෙන ටෙන්ඩර්කරුවන් හෝ බලය පවරන ලද නියෝජිතයින් නොපැමිණෙන ටෙන්ඩර්පත් අවලංගු කරනු ලැබේ.

අනතුරුව අවිස්සාවේල්ල මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව මගින් වැඩි මිල ගණන් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට පමණක් ටෙන්ඩර් පිරිනැමීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

ටෙන්ඩරයෙන් ප්‍රකාශයට පත් වූ දිනම මුදල ගෙවීමෙන් අනතුරුව ලබාගන්නා ලද රිසිට්පත සමග අදාල අධිකරණයට බලය පැවරූ ලිපිය ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් පසු එදිනම වාහනය උසාවි භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

චෙක්පත් භාර නොගන්නා අතර මුදල් පමණක් භාරගනු ලැබේ.

එම්. ඩී. එස්. අබේරත්න,
මහාධිකරණ විනිසුරු,
බස්නාහිර පළාත්බද මහාධිකරණය,
අවිස්සාවේල්ල.

08-456

# බඩු බාහිරාදිය විකිණීම්

**මහෙස්ත්‍රාත් අධිකරණය - වවුනියාව**

භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වවුනියාව මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවරුණු නඩුවලින් රාජසන්තක කරන ලද අයිතිකරුවන් නොමැති පහත සඳහන් භාණ්ඩ 2015.09.19 වැනි දින පෙ. ව. 9.30 සිට මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේ නම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය.

02. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

03. ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත් කිරීමට අධිකරණයට බලය ඇත.

04. භාණ්ඩ මිලදී ගත් වහාම අදල මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් ඉවත් කර ගත යුතු ය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

05. නඩු භාණ්ඩ මිලදී ගන්නා අය තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

වී. රාමකමලන්,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
වවුනියාව.

2015 ජූලි මස 28 වැනි දින.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ ලේඛන අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 01 | 94905 | 94/16 | සවල් 02 |
| 02 | 94787 | 171/14 | සවල් 01 |
| 03 | 96888 | 198/14 | සවල් 02 |
| 04 | 96701 | 144/14 | සවල් 01 |
| 05 | 94905 | 96/14 | උදලු 01 |
| 06 | 1777/15 | 45/14 | උදලු 01 |
| 07 | B/880/13 | 16/13 | උදලු 01 |
| 08 | - | - | උදලු 01 |
| 09 | - | 95/13 | උදලු 01 |
| 10 | 905/15 | 64/15 | උදලු 01 |
| 11 | - | - | බාල්දි 08 |
| 12 | AR/281/15 | - | බැටරි 01 |
| 13 | AR/160/15 | 95/14 | ස්ප්‍රේ යන්ත්‍ර 01 |
| 14 | - | - | මිටදිග කැත්ත |
| 15 | 905/15 | 64/15 | පිකැස් 01 |
| 16 | B//880/13 | - | පිකැස් 01 |
| 17 | - | 226/11 | පිකැස් 01 |
| 18 | - | - | අලවංගු 01 |
| 19 | B 886/13 | - | අලවංගු 01 |
| 20 | 908/15 | 64/15 | අලවංගු 01 |
| 21 | - | 356/15 | අලවංගු 01 |
| 22 | - | - | අලවංගු 03 |
| 23 | 53222 | - | විදුලි පංකා 01 |
| 24 | - | - | රේඩියෝ හිතාචි |
| 25 | - | - | ඇලුමිනියම් තාච්චි |
| 26 | 905/15 | - | වතුර මෝටර් 1 |
| 27 | AR/549/14 | 69/14 | සින්ගර් මහන මැෂින් 01 |
| 28 | - | - | කටු කම්බි රෝල් 02 |
| 29 | - | - | පෙට්ටි 02 |
| 30 | 69747 | - | වයර් රෝල් 02 |

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව - අංක 02**

| *යොමු අංකය* | *නඩු අංකය* | *වාහනය* | *ලි. ප. අංකය* | *වර්ගය* | *චැසි අංකය* | *එන්ජින් අංකය* |
|---|---|---|---|---|---|---|
| - | AR768/14 | යතුරුපැදිය | JY2508 | ටීවීඑස් - XL Super | MD 621DD1751C02069 | - |
| - | AR1076/14 | යතුරුපැදිය | - | Skyline RX 480 | LHJPCBL AB 100342 | IP39FMA10E00084 |
| - | AR767/14 | යතුරු පැදිය | HO 4145 | හීරෝ හොණ්ඩා | 03927F19308 | 03G27E14981 |
| LMC01 | 98992 | අත් ට්‍රැක්ටරය | - | සීපැන් 5195 N | AT004136 | - |
| M107 | 85503 | යතුරුපැදිය | 96-4038 | යමහා Mate 50 | V 50-4060300 | V50- 4060300 |
| M 60 | B 248/12 | යතුරු පැදිය | TW 5526 | ටීවීඑස් ස්කූටි | MD626BG3772 D66650 | OG3D72368041 |
| M 13 | B 1196/12 | යතුරුපැදිය | JK 8607 | ටීවීඑස් ස්කූටි | MD626AG1842 M57941 | 091K42151352 |

| යොමු අංකය | නඩු අංකය | වාහනය | ලි. ප. අංකය | වර්ගය | චැසි අංකය | එන්ජින් අංකය |
|---|---|---|---|---|---|---|
| M 87 | B 166/09 | යතුරුපැදිය | 123-9670 | යමහා Mate 50 | V 50-254320 | V50 - 254320 |
| M 43 | B 248/12 | යතුරුපැදිය | - | ටීවීඑස් Champ | MD 611CA-A04192 | - |
| M 29 | B 1158/09 | යතුරුපැදිය | MW 3786 | හීරෝ Stream | MD 303E2BR3L 933809 | EE043505 |
| M 42 | B 136/12 | යතුරුපැදිය | UB 7395 | බජාජ් ඩිස්කවරි | MD2DSJN77RCB10360 | JNGBRB39750 |
| M 46 | B 661/09 | යතුරුපැදිය | - | - | MBCHA11E289B0061 | - |
| M 21 | - | යතුරුපැදිය | - | - | MD611CCA2661N08035 | - |
| M 26 | - | යතුරුපැදිය | - | - | MD611CA2571-GO8468 | - |
| - | 94732 | යතුරුපැදිය | 149-3577 | යමහා Mate 50 | V50-6923421 | V 50-6923421 |
| - | 53908 | යතුරුපැදිය | MB 0498 | බජාජ් CT100 | UFBMA 92177 | DUMBA12006 |

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව - අංක 03**

| අනු. අංකය | යොමු අංකය | නඩු අංකය | වාහනය | ලි. ප. අංකය | මාදිලිය | වර්ගය | චැසි අංකය | එන්ජින් අංකය |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | - | 95601 | යතුරුපැදිය | VE5291 | ටීවීඑස් | Metro | MD625MF5791G66358 | CF5G91297400 |
| 02 | LMC02 | 97694 | අත් ට්‍රැක්ටරය | SI 7014 | සීපැන් | GN 12 | XY72205 | XY72205 |
| 03 | M106 | B1226/08 | යතුරුපැදිය | NDHC3635 | කයින්ටෙක් | - | DC50055789 | DC50055789 |
| 04 | M92 | B1284/08 | යතුරුපැදිය | GG 4320 | හොණ්ඩා | CD125T | CD125T1400983 | CD125TE1222791 |
| 05 | M58 | B248/12 | යතුරුපැදිය | - | හොණ්ඩා | MD 90 | MD902119429 | MD90E2119513 |
| 06 | - | 91424 | යතුරුපැදිය | MM6336 | හීරෝ හොණ්ඩා | Passion | 05J9C28655 | 05J08M26060 |
| 07 | M84 | - | යතුරුපැදිය | - | | Streem | LASTXKA17A0002711 | 1P39FMA10011711 |
| 08 | M81 | - | යතුරුපැදිය | GC 1401 | හොණ්ඩා | MTX | AD06 - 1306296 | AD061306295 |

08-454

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය සහ ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත් ව, 2016 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම්තැන වන මා විසින් 2015.08.25 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් සහ;

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැළකිලිමත් විය යුතු ය ඃ

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර ඃ-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්, හා

*(ආ)* වත්කම් සහතිකයක් සමග
ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතු යි. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර 'වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි' ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30 ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම්තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී රා රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදල් වලින් හෝ බැංකුවකින් 'ගෙවීම් සඳහා' සලකුණු කර චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2015.09.23 වැනි දින පෙ. ව. 10.30 ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත -ගම්පොළ.

2015 ජූනි මස 17 වැනි දින,
උඩපළාත,
ගම්පොළ.
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***2016 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තුව***

| අනු. අංකය හා නම | | කොට්ඨාසය | තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය | තැබෑරුම විවෘත කර තබන වේලාව | ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත |
|---|---|---|---|---|---|---|
| 01. | වහුගපිටිය රා තැබෑරුම | උඩපළාත | වහුගපිටිය ගම තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2015.08.25 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 1,500.00 |
| 02. | පුස්සැල්ලාව රා තැබෑරුම | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා | 2015.08.25 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 3,000.00 |

08-284/1

---

**බේරුවල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය**

2016 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

1982.08.20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලට යටත්ව 2016 වර්ෂය තුළ රා සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා බේරුවල ප්‍රාදේශීය ලේකම් තැන වන ම විසින් 2015.08.28 වැනි දින පෙ. ව. 10.30 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නිසි ආකෘති පත්‍රයේ සකස් විය යුතු අතර-

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ වත්කම් සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර්පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින්ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන් යොදා තිබිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය. මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරනු ලබන ටෙන්ඩර් පත්‍ර -

(අ) ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත්කර ලබාගන්නා ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සිය; සහ

(ආ) වත්කම් සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තැබූ ලියුම් කවරයෙහි වම් කෙළවර මුදුනේ තැබෑරුම් අංකය හා නම සඳහන් කර ටෙන්ඩර් භාරගැනීම අවසන් කිරීමට ප්‍රථම බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

එසේ නැතහොත් ටෙන්ඩර් භාරගන්නා වේලාව ඉකුත්වීමට ප්‍රථමයෙන් බේරුවල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එසේ එක් එක් රේන්දයක් වෙනුවෙන් භාර ගැනීම් අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන් හි දී සියලුම ටෙන්ඩර්කරුවන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායි ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින පස්වරු 2.30 ට පෙර ප්‍රාදේශීය මහලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යටකී බේරුවල රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහායි ලකුණු කර චෙක්පතකින් හෝ මහජන බැංකුවෙහි හෝ ආරක්ෂිත චෙක්පත් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ විය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2015.09.16 වැනි දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

07. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැකිය.

කේ. ජී. ඩී. චතුර මල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
බේරුවල.

2015 ක් වූ ජූලි මස 24 වැනි දින,
බේරුවල මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| අනුක්‍රමික අංකය | කොට්ඨාසය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | නැවත විකුණන වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01. | බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය | අළුත්ගම උප කාර්යාලයේ සීමාව | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ රාත්‍රී 8.00 | 2,000 | 2015 අගෝස්තු 28 වැනි දින පෙ. ව. 10.30 | 2015 සැප්තැම්බර් 16 වැනි දින පෙ. ව. 10.30 දක්වා |

***සැලකිය යුතුයි.***- 2016 වර්ෂයට දැනට රා තැබෑරුම් පිහිටා ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. අලුත් ස්ථානයක තැබෑරුම් විවෘත කරන්නේ නම් ඒ සම්බන්ධයෙන් බේරුවල ප්‍රාදේශීය මහ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

08-341

# රජයේ නොවන දැන්වීම්

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව බී. බ්‍රෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2010 සැප්තැම්බර් මස 29 වැනි දින සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නාමය : බී. බ්‍රෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 74559
ලියාපදිංචි කාර්යාලය : 11 මහල, HNB ටවර්ස්, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

බී. බ්‍රෝන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

08-289

---

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම්දීම

2007 අංක 07 දරන ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පනතේ 9 (1) වගන්තිය අනුව 2015 ජූලි මස 16 වැනි දින සීමාසහිත සිල්ක් රෝඩ් 9 (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ව්‍යාපාර නාමය : සිල්ක් රෝඩ් 9 (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කළ දිනය : 2015.07.16
ව්‍යාපාර අංකය : PV 106894
ලියාපදිංචි ලිපිනය : අංක 425, කොළඹ පාර, කොස්ගම.

08-291

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

නම : Thai Aluminium (Private) Limited
PV No: PV 92233
දිනය : 2013.04.29

A. S. M. Ismaath,
ලේකම්.

195, Layard's Broadway,
Colombo 14.

08-292

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

කොළඹ 05, කිරුලපන, දුම්රියපොල මාවතේ අංක 29 දරන ස්ථානයේ පදිංචි සිරිසේන කන්නංගර විජේතුංග (ජා. හැ. අංක 323111596 V) දරන වන මම කෝට්ටේ, කෝට්ටේ පාරේ 653/4 A දරන ස්ථානයේ පදිංචි බෙන්තරගේ චාන්දනී මල්කාන්ති අල්විස් (ජා. හැ. අංක 697311564 V) නැමැත්තියට වර්ෂ 2010 ජූලි මස 29 වැනි දින නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් අනූෂා රණසිංහ මිය විසින් ලියන ලද අංක 434 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය 2015 ජූලි මස 05 වැනි දින සිට මා විසින් අවලංගු කරන බවට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

08-295

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ස්ටැපල් හෝල්ඩිංස් (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96103
ලියාපදිංචි කාර්යාලය : අංක 35, අරණායක පාර, මාවනැල්ල
සංස්ථාපිත කළ දිනය : 2013 දෙසැම්බර් 13.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

08-299

---

### දැන්වීමයි

2007 සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : ඩී ඇන්ඩ් ඩී ඉන්ටර්නැෂනල් ෆුඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 106832
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි මස 8 වැනි දින.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (පීවීටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

08-300

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : වන් ඕක් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106636
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 21/1, බුලර්ස් පටුමග, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2015.06.29

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-301

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 18, විදුලිපුර, නෝර්ටන් බ්‍රිජ් පදිංචි යද්දල ගමරාලලාගේ සොම්පාල වන මම මට අයිති ඇබඩීන් දෙක අංක 112 දරන පිඹුරේ 217 දරන ඉඩම නාවලපිටිය නීතිඥ මනෝරි ජයලත් මහත්මිය 2005.11.22 වැනි දින ලියා සහතික කළ 5496 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ ඇබඩීන් දෙක පදිංචි, වෙදගෙදර කමනි විජේනායක බලකරු ලෙස පත් කරන ලද අතර එකී ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර නිශ්ප්‍රභා කළ බවත්, මින් ඉදිරියට එකී බලපත්‍රය මගින් කරන යම් ක්‍රියාවකට හෝ ගනුදෙනුවකට මා වගකීම් නොදරන බව රජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

වයි. ජී. සොම්පාල,
ජා. හැ. ප. අංක 380851245 V.
(යද්දල ගමරාලලාගේ සොම්පාල)

2015 ජුනි මස 23.

08-336

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ ජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : සී/ස මනුප්ලාස් විලා (පුද්ගලික සමාගම)
ලියාපදිංචි අංකය : PV 99176
දිනය : 2014.06.18
ලියාපදිංචි කාර්යාලය : අංක 93/ඒ, සමාධි මාවත, බේරුවල.

සමාගම් ලේකම්.

08-337

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 11, හෙට්ටි වීදිය, අංක 304 හි පදිංචි ෆාතිමා සාකීර් හුසේන් කම්රුඩීන් විවාහයට පෙර වෙරෝනික්කා ද සිල්වා වික්‍රමතිලක වන මම විසින් කොළඹ 11, හෙට්ටි වීදිය, අංක 304 දරන ස්ථානයේ පදිංචි සාකීර් හුසේන් කම්රුඩීන් සහ ඉම්රාන්අලි කම්රුඩීන් යන අය වෙනුවෙන් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වන ශ්‍රී රාගවන් නාරායනසාමි මහතා විසින් 1986.10.10 දින හා අංක 2022 යටතේ ලියා සහතික කරන ලද හා කොළඹ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ 61 වන කාණ්ඩය 173 වන පත් ඉරුවේ දිනපොත් අංක 841 යටතේ 1986.10.16 දින දී ලියා පදිංචි කර ඇති ඇටෝර්නි බලපත්‍රය, බල රහිත කොට අවලංගු කරන බව මින් ප්‍රකාශ කරන අතර, මින් පසුව ඔවුන් විසින් සිදුකරනු ලබන කිසිම ක්‍රියාවකට, බලයකට ඔප්පුවකට හෝ කරුණකට ඔවුන් වෙනුවෙන් මම වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

ෆාතිමා සාකීර් හුසේන් කම්රුඩීන්,
විවාහයට පෙර වෙරෝනික්කා ද සිල්වා වික්‍රමතිලක.

08-338

---

## ඇටෝර්නි බලපත්‍රය අහෝසි කිරීම

කැප්පෙටිවලාන, බෝයවලාන පදිංචි (ජා. හැ. අංක 832160172 V) දරන සඳලංකාවලගේ සාලිය සම්පත් සඳලංකා වන ඇටර්නි අධිපති වන මම මා විසින් කැප්පෙටිවලාන, බෝයවලාන පදිංචි (ජා. හැ. අංක 653411766 V) හිටි හාමිලාගේ කුමාරසිංහ වන ඇටර්නි බලකරු නමට ලියන ලද වර්ෂ 2011.01.03 දිනැති ප්‍රසිද්ධ නොතාරිස් අනුර ටී. බී. හේරත් විසින් ලියා සහතික කළ අංක 1432 කුරුණෑගල රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයේ ලියා පදිංචි කළ වර්ෂ 2011.02.07 දිනැති කාණ්ඩ අංක 2477, 329 පත්ඉරුවේ සටහන් වී ඇති ඇටර්නි බලපත්‍රය මෙසේ අවලංගු කර අහෝසි කරන බවත් මින් මතු එකී ශ්‍රී ඇටෝර්නි බලපත්‍රයේ කිසිදු නීත්‍යානුකූල වගකීමක් නොමැති බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සාමාන්‍ය ජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සාලිය සඳලංකා,
ඇටර්නි අධිපති.

2015 ජූලි මස 23 වැනි දින.

08-339

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ගේන් ලොජිස්ටික්ස් ගෲප් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106825
ලියාපදිංචි ලිපිනය : අංක 6/280 ඉලුක්මෝදර එස්ටේට්, ගුරුදෙණිය 20189, මහනුවර
සංස්ථාගත කළ දිනය : 2015.07.07

සමාගම් ලේකම්.

08-361

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අයිකන්ටැක්ට්ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106664
ලියාපදිංචි කාර්යාලය : අංක 109/ඒ, උසාවි පාර, ගම්පහ
සංස්ථාපනය කළ දිනය : 2015.06.30.

ලේකම්.

08-362

### ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ආඩිඅම්බලම, තේක්කවත්ත, අංක 42/4 හි පදිංචි මුනිදස පතිරනගේ සුරේන්ද්‍ර ආරියසේන වන මම ලක්ෂ්මන් සිරිවර්ධන ගීකියනගේ ප්‍රසිද්ධ නොතාරිස් අංක 7101 සහ 2013.08.02 වැනි දින දරන ඇටෝර්නි බලකරය අනුව ගලගෙදර ආරච්චිලාගේ දිලිකා සංජීවනී වීරසිංහ යන අය පත්කිරීම මෙයින් අවලංගු කරන අතර ඇය විසින් මින්මතු කරනු ලබන කිසිම ක්‍රියාවක් මෙතැන් සිට බලාත්මක නොවන බව ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

මුනිදස පතිරනගේ සුරේන්ද්‍ර ආරියසේන.

08-363

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සිසිල ලෑන්ඩ් සේල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107194
ලියාපදිංචි ලිපිනය : 26/3, රදවාන පාර, වතුරුගම, ගම්පහ.
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි 21 වැනි දින.

සමාගම් ලේකම්.

08-367

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සමාගම් සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : ඇඩ්වෙන්ට් ග්ලෝබල් ස්පෝට්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 105777
ලියාපදිංචි කළ දිනය : 2015.05.21
ලියාපදිංචි කළ ලිපිනය : අංක 10, ගුණසේකර මාවත, කොළඹ 08

සමාගමේ නම : ඇඩ්වෙන්ට් ග්ලෝබල් මෝටර් කෝපරේෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 106091
ලියාපදිංචි කළ දිනය : 2015.06.05
ලියාපදිංචි කළ ලිපිනය : අංක 10, ගුණසේකර මාවත, කොළඹ 08

සමාගමේ නම : අන්වාසල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 106223
ලියාපදිංචි කළ දිනය : 2015.06.10
ලියාපදිංචි කළ ලිපිනය : අංක 40/15, ලේක් ගාර්ඩින්ස් ඕෆ් ලේක් ඩ්‍රයිව්, රාජගිරිය.

සමාගමේ නම : ඩිලන්ගෝ කාර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 106162
ලියාපදිංචි කළ දිනය : 2015.06.09
ලියාපදිංචි කළ ලිපිනය : අංක 17/110, පන්සල පාර, මහරගම.

සමාගමේ නම : ඩිලන්ගෝ ප්‍රොපර්ටි (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 105669
ලියාපදිංචි කළ දිනය : 2015.05.19
ලියාපදිංචි කළ ලිපිනය : අංක 17/110, පන්සල පාර, මහරගම.

සමාගමේ නම : පවාත් ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 106161
ලියාපදිංචි කළ දිනය : 2015.06.09
ලියාපදිංචි කළ ලිපිනය : අංක 7/3, ඩයස් පෙදෙස, පානදුර.

සමාගමේ ලේකම්.

08-368

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2015.06.30 දින සිට සංස්ථාගත කර ඇත.

සමාගමේ නම : කේවිස් රෙස්ටුරන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106655
ලියාපදිංචි ලිපිනය : අංක 343, නව නුවර පාර, කොතලාවල, කඩුවෙල

කෝපරේට් මැනේජ්මන්ට් කන්සල්ටන්ස්
ඇන්ඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

08-369

---

### නිවේදනයයි

කඩුවෙල ඉහල බෝමිරිය අංක 112/2 සී දරන ස්ථානයේ පදිංචි ඒබ්‍රම්වත්තෙගේ ඉන්ද්‍රාවති රුද්‍රිගු මුණසිංහ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ එහි පොදු මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලබන වගනම් ප්‍රසිද්ධ නොතාරිස් රස්මරා අබ්දීන් විසින් සහතික කරන ලදුව කොළඹ 08, රොඩ්නි වීදියේ අංක 78/3 හි පදිංචි දර්ශන ජයන්ත පතිරණ වෙත මා විසින් ප්‍රදානය කරන ලද අංක 1347 සහ 2013 ඔක්තෝබර් මස 01 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බවටත් එය මෙතැන් සිට බලරහිතව හා ශූන්‍ය ලෙස සැලකිය යුතු බවත් ය.

08-372

---

### මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව එෆ් ඇන්ඩ් එෆ් නිපෝන් ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2012 මැයි මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : එෆ් ඇන්ඩ් එෆ් නිපෝන් ලංකා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85748
ලියාපදිංචි ලිපිනය : අංක 59, හංසගිරිය, කල්එළිය

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

08-377

### සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වන වගන්තිය යටතේ සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳ දැනුම් දීමයි

සමාගමේ නම : මවුන්ට් ලොජ් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 104628
සමාගම සංස්ථාපනය කළ දිනය : 2015.03.12
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 33, චන්ද්‍රලේඛා මාවත, කොළඹ 08
ලේකම් : නීතිඥ එම්. ලේඛා එම්. කුරේ.

08-409

---

### ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : රොනිම් නර්සිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107094
ලියාපදිංචි ලිපිනය : අංක 605/5, දරණගම, දෙල්ගොඩ
සංස්ථාගත කිරිමේ දිනය : 2015 ජූලි 16

සමාගම් ලේකම්.

08-410

---

### ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සැක් ලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106814
ලියාපදිංචි කාර්යාලය : අංක 148, මොරිස් පාර, ගාල්ල
සංස්ථාගත කිරිමේ දිනය : 2015 ජූලි 07

සමාගම් ලේකම්.

08-411

---

### ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : බීමැක්ස් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106805
ලියාපදිංචි ලිපිනය : අංක 581/1, කොබෝදුව පාර, කුඩා වස්කඩුව, වස්කඩුව, කලුතර
සංස්ථාගත කිරීමේ දිනය : 2015 ජූලි 07

සමාගම් ලේකම්.

08-412

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

ලියාපදිංචි සමාගමේ නම : ඩිස්කවර් ලංකා ටුවර්ස් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 106440
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : කඩ සාප්පු සංකීර්ණය (Shopping Complex) A, ගොඩනැගිල්ල, පළමු මහල, කඩ අංක 80, මීගමුව.
සංස්ථාගත කිරීමේ දිනය : 2015 ජුනි 19

ලේකම්.

08-413

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

නම : Aravinda Imports (Private) Limited
PV No. : PV 93095
දිනය : 2013.06.18
ලිපිනය : 95 1/2, Maliban Street, Colombo 11

M. T. E. Gunathilaka,
ලේකම්.

08-416

---

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල හීන්පැන්දල පාර, අංක 50/2 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 625811104 වී දරන ශාන්ති වික්‍රමතුංග සෙනෙවිරත්න වන මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල, කලුවැල්ල, කොළඹ පාර, අංක 31 හි පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 600991094 වී දරන චන්දන ජගත්ප්‍රිය නානායක්කාර යන අය මාගේ ඇටර්නිබලකරු ලෙස පත් කරමින් ඔහු වෙත බලය පවරමින් ප්‍රසිද්ධ නොතාරිස් දයාපාල වරාගොඩ විතාරන මහතා විසින් වර්ෂ 2008.08.11 වැනි දින ලියා සහතික කරන ලද අංක 4185 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2015.07.28 වැනි දින සිට අවලංගු කර, ශුන්‍ය සහ බලරහිත කරන බවත් මෙතැන් සිට එකී ඇටර්නි බලපත්‍රය මත එකී ඇටර්නිබලකරු විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකියනු නොලබන බවත් ශ්‍රී ලංකා ජනරජයට සහ සියලු දෙනාටම මම මෙයින් නිවේදනය කරමි.

ශාන්ති වික්‍රමතුංග සෙනෙවිරත්න.

08-433

### ප්‍රසිද්ධ දැන්වීමයි

ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ් සමාගම 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තියට අනුකූලව 2015 ජූලි දහහත් වන දින, සිය නම එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ් යනුවෙන් වෙනස් කොට ඇති බව එකී සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ අලුත් නම : එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පීබී 965
ලියාපදිංචි කළ කාර්යාලය : අංක 168, නාවල පාර, රාජගිරිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ශිරෝමි හල්ලොලුව,
ලේකම්,
එච්එන්බී ග්‍රාමීන් ෆිනෑන්ස් ලිමිටඩ්.

08-437

---

### දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් ආඥපනතේ අංක 09 (1) දරන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කිරීම සම්බන්ධයෙන් වන දැන්වීමයි

සමාගම සංස්ථාගත කළ නාමය : ඔස්-සී ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ අංකය : පී වී 107082
සංස්ථාගත කළ ලිපිනය : අංක 17, කීල්ස් නිවාස, කළල්ගොඩ, පන්නිපිටිය.
සංස්ථාගත කළ දිනය : 2015.07.16

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

අංක : SEC/1(b)(1)/2005/3215.

08-442

---

### 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) ට අනුව සමාගමේ ලියාපදිංචි අංකය හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය දන්වන ප්‍රසිද්ධ දැන්වීම.

සමාගමේ නම : එස්. ඒ. ලංකා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 107262
සංස්ථාපනය කළ දිනය : 2015.07.23
සමාගමේ ලිපිනය : අංක 34, කෙනල් පාර, වට්ටකළිය, හලාවත.

ලේකම්.

08-448

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමේ නාමය : එච් ආර් එල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106767
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 57, රොස්මීඩ් පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2015.07.06

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-452

---

### සමාගම් නාමය වෙනස්කිරීම සම්බන්ධව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2015 ජූනි 10 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ලංකා කල්චර් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : ලංකා කල්චර් ඇන්ඩ් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 103382
ලියාපදිංචි කාර්යාල ලිපිනය : 13 වැනි මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, ඇචිලන් චතුරශ්‍රය, කොළඹ 01

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

08-453

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය

1982 වර්ෂයේ අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී වලංගුව පවත්නා සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් යටත්ව, 2016 වර්ෂය තුළ විදේශ මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිලදී ගැනීම සඳහා උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන වන, මා විසින් 2015.08.26 වැනි දින පෙ. ව. 10.30ට ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නිසි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර,

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක්, සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් තැනගෙන් ලබාගත් ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපළ පිළිබඳ වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කෙරේ. ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවය සම්බන්ධයෙන් විශේෂයෙන් සැලකිලිමත් විය යුතු යः-

(i) ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර පෝරමවල නියමිත සාක්ෂිකරුවන් අත්සන් යොදා තිබිය යුතු ය;

(iii) සෑම වෙනස් කිරීමක් හෝ කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන සහ දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙහි නියමයන්ට පටහැනිව ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත්ව සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍ර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල තැන්පත් කර ලබා ගන්නා ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුවිතාන්සියක්; හා

*(ආ)* වත්කම් සහතිකයක් සමග
ලියුම් කවරයක බහා මුද්‍රා තබා ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවර තැබෑරුමේ අංකය සහ නම සඳහන් කර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් කිරීමට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථමයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැනට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. එක් එක් රේන්දයක් වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව පහත සඳහන් උපලේඛනයේ සඳහන් කර ඇත. එකී වේලාවන්හි දී සියලුම ටෙන්ඩර්කරුවන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩරයක් ඉදිරිපත් කර "වරප්‍රසාද මිල දී ගත් තැනැත්තායැයි" ප්‍රකාශ කරනු ලැබූ පසු එම දින ප. ව. 2.30ට පෙර උඩපළාත ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප වශයෙන් උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කොට යට කී විදේශ මත්පැන් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදල්වලින් හෝ බැංකුවකින් ගෙවීම් සඳහා සලකුණු කර චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පත් නැමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

06. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද 2015.09.25 වැනි දින පෙ. ව. 10.30ට නැවත විකිණීම සිදු කරනු ලැබේ. එදිනට ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. වැඩි විස්තර උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැනගත හැකි ය.

යූ. පී. ඉන්දික අනුරුද්ධ පියදාස,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත- ගම්පොල.

2015 ජූනි මස 17 වැනි දින,
ගම්පොල- උඩපළාත,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2016 වර්ෂය සඳහා ගම්පොල උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කරන ලද විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව*

| *අනු. අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කර තබන වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 01. පුස්සැල්ලාව | උඩපළාත | පුස්සැල්ලාව නගර සීමාව තුළ | පෙ. ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප. ව. 8.00 | 2015.08.26 වැනි දින පෙ. ව. 10.30 දක්වා | 3,000.00 |

08-284/2

---

**අඹගමුව කෝරළයේ විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය**

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2016 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 2015.09.14 වැනි දින පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ඇප මුදලක් ද වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදලක් ද තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්තගෙන්/ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික කිරීම පිළිබඳ යථෝක්ත විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ;

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි සැළකිලිමත් විය යුතු ය :

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි පහත සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය.

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතර ව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය.

(iii) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකු ම ටෙන්ඩර් පෝරම සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන් ට පටහැනි වූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා, සීල් තබා, කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංක හා නම සඳහන් කර, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවේ ටෙන්ඩර්කරුවන් අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් ගිනිගත්හේන මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා ගැනීමට එකඟ විය යුතු ය. මෙම තැන්පතු මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂිත චෙක්පත්'' ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා 2015.11.07 වැනි දින පෙ. ව. 10.30ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

11. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතුය.

එච්. එම්. සී. කේ. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය.

2015 ජූලි මස 17 වැනි දින,
ගිනිගත්හේන අඹගමුව කෝරළයේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*විදේශ මත්පැන් තැබෑරුම්*

| *අංකය* | *තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01. | නෝර්වුඩ් | නෝර්වුඩ් නගර බල ප්‍රදේශය අංක 03 තුළ | 2015.09.14 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 02. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 04 තුළ | 2015.09.14 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 03. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 05 තුළ | 2015.09.14 පෙ. ව. 10.30 | රු. 5,000 |

08-282

**කොළඹ දිස්ත්‍රික්කය - මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

රටබීම තැබෑරුම් සඳහා රේන්ද විකිණීම - 2016 වර්ෂය

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද සමග ටෙන්ඩර් පත්‍ර එවිය යුතු ය. එම වත්කම් සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් (05) වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අළුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය :-

*(ඒ)* ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
*(බී)* කොළඹ 02, ස්ටේපල් වීදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(සී)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයේ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. "2016 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2015.09.15 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල්, තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම් වෙත ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන් සුරාබදු බලපත්‍රකරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසිදු හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම, මොරටුව මහ නගර සභා, කොට්ඨාස අංක 09 හි පවත්වාගෙන යා යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය ප්‍රදේශයේ තැබෑරුම් අයත් විය යුතු ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල (රු.)* | *ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව* | *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1. | අංක 9 කොට්ඨාසය, මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 09 කොට්ඨාසයේ ගාළු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2015.09.15 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්* . - 2015.09.15 වැනි දින විකිණීමට නොහැකි වුවහොත් මෙම විදේශීය මත්පැන් රේන්දය 2015.11.17 වැනි දින පෙ.ව.10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. සී. නිරෝෂන්,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2015 ජූලි මස 06 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08-429

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## මහජන බැංකුව

නුගේගොඩ නගර (335) සහ දෙහිවල ගාලු පාර ශාඛාව (337)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත 2015 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.30 ට මෙහි පහත විස්තර වන දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාවේ කොට්ඨාස අංක 05 (හත්බෝධිවත්ත) තුළ කළුබෝවිල ගමේ පාසල් ඇවනිව් හි පිහිටියා වූ ද පාසල් ඇවනිව් හි වරිපනම් අංක 53 හා 53A දරන ''බෙලිගහවත්ත'' යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. වී. එම්. සමරනායක විසින් සාදන ලද අංක 4868 හා 2012.01.24 වැනි දින දරන පිඹුරේ ලොට් O ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : පාසල් ඇවනිව් ද, නැගෙනහිරට : පාසල් ඇවනිව් හි වරිපනම් අංක 51 ද, දකුණට : පාර ද, බස්නාහිරට : හත්බෝධිය පාරේ වරිපනම් අංක 45 (අංක 661 ඒ දරන සැලැස්මේ ලොට් C) ද, මායිම් වන්නාවූ ද, එකී අංක 4868 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම බිංදුවයි හයක් (අ. 0 රූ. 0 පර්. 15.06) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ඉහත දැක්වෙන ඉඩම පහත විස්තර කරන ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ කළුබෝවිල ගමේ පිහිටියා වූ ද, දැනට පාසල් ඇවනිව් හි වරිපනම් අංක : 53 දරන්නාවූ ද, ''බෙලිගහවත්ත'' හෙවත්, ''දෙල්ගහවත්ත'' යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් විසින් සාදන ලද අංක 661 ඒ සහ 1967.01.15 දින දරන පිඹුරේ ලොට් ඩී ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : පාසල් ඇවනිව් ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු එල්. ඩැනියෙල්ගේ අංක 1281 දරන පිඹුරේ දැක්වෙන මෙම ඉඩමේ ලොට් බී කොටසද, දකුණට බලයලත් මිනින්දෝරු එල්. ඩැනියල්ගේ අංක 1281 දරන පිඹුරේ ලොට් සී දරන මෙම ඉඩම් කොටස ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු වී. සිවසුන්දරම් ගේ අංක 661 ඒ දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම බිංදුවයි හයයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 15.06) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

වැඩි විස්තර සඳහා 2014.10.17 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද, 2015.02.20 දිනැති දිනමිණ හා ඩේලිනිව්ස් පුවත්පත්වල පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීමේ මාර්ග විස්තරය*.- නුගේගොඩ කලාප කාර්යාලයේ සිට කළුබෝවිල රෝහල පරිශ්‍රය පසුකර ඉදිරියට ගොස් දකුණු පසට ඇති අල්විස් මාවතේ මීටර් 100ක් පමණ ගිය විට වම්පසට ඇති පාසල් මාවතේ මීටර් 200ක් පමණ ගමන් කරන විට පාරේ වම් පසින් අංක 53 දරන මෙම දේපළ පිහිටා ඇත. ප්‍රවේශගත බාධක නොමැත. මෝටර් වාහනයකින් දේපළට ප්‍රවේශ විය හැක.

*ගෙවීමේ ක්‍රමය*.- සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලා වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බද්ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරුගේ හා නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත නුගේගොඩ, හයිලෙවල් පාරේ අංක 177ඒ පිහිටි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය කළමනාකරු වෙත (කොළඹ පිටත) බටහිර කළාප II වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2816939, 2812260, 4305863 ෆැක්ස් අංකය : 4305863.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු), වෙන්දේසිකරු හා
තක්සේරුකරු, උසාවි කොමසාරිස් හා
දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 0718 021206 0710 821811

08-423

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඩී. ජයමාන්න/යූ. ජී. සී. ඩී. කරුණාරත්න,
ගිණුම් අංක : 0054 5000 0185

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අගෝස්තු මස 04 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහත් ලක්ෂ හාර දහස් හත්සිය අසූ දෙකයි ශත දහ නමයක (රු. 17,04,782.19) මුදල ද, 2010 මැයි 14 වැනි දින සිට අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් දහතුන් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හතලිස් හතයි ශත හතලිස් එකක (රු. 13,57,547.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) හා තවත් රුපියල් දෙලක්ෂ තිස් දහසක (රු. 2,30,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.09.17 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ*, 2010.09.03 දින දිවයින, සහ තිනකුරල් සහ අයිලන්ඩ් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2015.09.09 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ගුවට් හතර වටරැක ග්‍රාමයේ පිහිටි ''වටරැක එස්ටේට්'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1999.03.03 දතම හා අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 109 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට :මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරටඃ ලොට් 2 a හි ලොට් 2 D දකුණට : එම ඉඩමේ ලොට් 108 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 110 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 13.30) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව මෙළුම/පත්‍රිරුව A 593/213 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වටරැක ග්‍රාමයේ පිහිටි ''වටරැක එස්ටේට්'' යයි කියනු ලබන ඉඩමට එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 110 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 111 සහ මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : මුල් පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එම ඉඩමේ ලොට් 109 දකුණට : එම ඉඩමේ ලොට් 109 සහ 56 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 111 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි හතරක් (අ. 0 රූ. 0 පර්. 10.04) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව A 593/214 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 සහ ලොට් 56 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් සමූහයේ ලේකම්.

08-415

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. - අම්බලන්තොට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙඩම්පහල බටහිර ග්‍රාම නිලධාරී වසමේ වැල්ලබඩ පත්තුවේ දෙඩම්පහල ගමේ පිහිටි බටබැඳිගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. කරුණාදස විසින් 2009 නොවැම්බර් මස 08 වැනි දින මැන සාදන ලද අංක 2752 දරන පිඹුරේ ලොට් 1 දරන, ඉඩම.

ප්‍රමාණය : රූඩ් දෙකක් (අ. 0 රූ. 2 පර්. 0) විශාලත්වයෙන් යුත් ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් සමග වේ.

තරිඳු ජනක ප්‍රතාපසිංහ සහ තිප්පල ගමගේ ස්වර්ණලතා ගුණවර්ධන ණයකරුවන් ලෙස සහ තරිඳු ජනක ප්‍රතාපසිංහ උකස්කරු ලෙස කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී ට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2015ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින ප. ව. 1.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2015.02.13 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2015.08.14 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2015.08.17 වැනි දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.* - දික්වැල්ල නගරයේ සිට තංගල්ල පාරේ (මහවෙල හරහා) කි. මී. 182 කණුව වෙත පැමිණ (විජිත සෙන්ට්‍රල් විද්‍යාලය පසුකර) කි. මී. 2ක් පමණ දුරක් ගොස් මීටර් 100ක් පමණ ගිය විට අදාළ දේපළ වෙත ළඟාවිය හැක. අදාළ දේපළ දකුණු අත පැත්තේ පිහිටා ඇත. (ශයලිනා සර්විස් සෙන්ටර්)

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තුව රු. 2,000, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම්කරු විසින් අකාලිත වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හා ප්‍රධාන කාර්යාලයේ හෝ අම්බලන්තොට ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ෆැක්ස් : 011 2445393
ඊමේල් : senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 157,
තිස්ස පාර, අම්බලන්තොට,
දුරකථන අංක : 047 - 2223819
ෆැක්ස් අංකය : 047 - 2223817.

08-421

---

## සෙලාන් බැංකුව පීඑල්සී - මීගමුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 04 වන වගන්තිය යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මීගමුවෙහි සිය ලියාපදිංචි අංක පීවී 9624 හි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන වෙහිකල්ස් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් සහ මීගමුව හි පදිංචි හන්දුන් හර්ෂ ප්‍රභාත් ද සිල්වා යන අය බන්ධනදායි වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එම්. ගුණසිංහ විසින් දෙකම සහතික කරන ලද දෙකම 2012 නොවැම්බර් මස 19 වැනි දිනැති අංක 2740 සහ 2741 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති පහත 1 වන සහ 2 වන උපලේඛනවල සඳහන් දේපළ සහ පරිශ්‍රය වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 28 වැනි දින පිළිවෙලින් පෙ. ව. 10.30 ට සහ පෙ. ව. 10.45 ට දේපළ පිහිටි ස්ථානයේ දී සෙලාන් බැංකුව පී එල් සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුති දන්වීම*.- 2015.07.03 දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද 2015.06.22 දිනැති ඩේලිමිරර් ලංකාදීප සහ 2015.07.06 දිනැති තිනක්කුරල් පුවත්පත් හි පළ වී ඇත.

#### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2009.09.14 දිනැති අංක 6392 සැලැස්මේ නිරූපණය වන ගිරිඋල්ල පාර වරිපනම් අංක 363 සහ 367/1 දරන දවටගහවත්ත සහ මාවතගහවත්ත හෙවත් දවටගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස රූඩ් එකයි පර්චස් තිස් අටයි දශම එකයි පහක් (අ. 0 රූ. 1 පර්. 38.15) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

#### දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ දූනගහ පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව පිහිටි බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් සාදන ලද 2011.12.27 දිනැති අංක 6962/1 සැලැස්මේ නිරූපණය වන ගිරිඋල්ල පාර වරිපනම් අංක 365 දරන දවටගහවත්ත නමැති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස විස්සයි දශම හයයි පහක් (අ. 0 රූ. 0 පර්. 20.65) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම*.- මීගමුව නගර මධ්‍යයේ සිට ප්‍රධාන වීදිය ඔස්සේ කොප්පරා හන්දියෙන් මීරිගම පාරේ "Y" හන්දියෙන් ගිරිඋල්ල පාරේ සිට කිලෝ මීටර් 1ක් යන විට වම් පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%, (2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%, (3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%, (4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000, (5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 500, (6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය (7) ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරිනී - (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011- 2456485, 011- 2456479.

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9, අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ, හෝමාගම.
දුරකථන අංක : 071 4318252 - 011- 2173282.

08-348

### හැටන් නැෂනල් බැනක් පීඑල්සී - ගලහා ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඉතා වටිනා පදිංචියට ව්‍යාපාරයකට සුදුසු සියලු පහසුකම් සහිත දේපළක් කෑගල්ල නගර සභා සීමාව තුළ රන්වල ගමේ කොළඹ - මහනුවර ප්‍රධාන මාර්ගයට මායිම්ව පිහිටි මොරගහමුල හේන සහ පනාවත්තේහේන නමැති ඉඩමට බලයලත් මානක සී. කුරුකුලසූරිය විසින් මැන සාදන ලද 1997.04.18 වැනි දින අංක පී. 2635 දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 46 (ඉහත කී පිඹුරු අංක පී. 2635 හි නිරූපිත ලොට් 5 දරන මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය ද සමග)

මෙම දේපළ වැවිට විදානලාගේ මාධව කීර්ති සුරන්ජිත් වැවිට නොහොත් මාදව කීර්ති සුරන්ජිත් වැවිට යන අය බන්ධනදයි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපලට පිවිසීම.*- කෑගල්ල නගර මධ්‍යයේ සිට කොළඹ මාර්ගයේ කි. මී. 03ක් පමණ 75/8 දරන බෝක්කුව දක්වා ගමන් ගත් විට මෙම දේපළ මෙම මාර්ගයේ වම් පසින් මාර්ගයට මුහුණලා පිහිටා තිබේ. (වරිපනම් අංක 617 කොළඹ පාර)

2015 ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.11.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේද* 2014.12.02 වැනි දින ඩේලිමිරර්, ලක්බිම, හා තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081- 2210595/071-4755974/ 071- 8446374/ 077- 7761706

08-294